සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය**    **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය (88) - I**    **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ශාක කඳක ඉරි මදය වටා වාර්ෂිකව වැඩෙන කොටස වාර්ෂික වළලු යනුවෙන් හැඳින්වේ. මෙම වාර්ෂික වළලු පිළිබඳ සත්‍ය නොවන ප්‍රකාශය තෝරන්න.

    (1) කඳක ඉරිමදය වටා වාර්ෂිකව වැටෙන කොටස වාර්ෂික වළලු යනුවෙන් හැඳින්වේ.

    (2) සර්ම කලාපයේ වැඩෙන ගස්වල වාර්ෂික වළලු ඉතාමත් ළඟින් පිහිටන නිසා පැහැදිලිව හඳුනා ගැනීමට අපහසුය.

    (3) වර්ෂා කාලයේදී වාර්ෂික වළල්ලේ වැඩීම වේගවත්වන අතර වියලි කාලයේදී වැඩීමේ වේගය අඩුය.

    (4) වේගයෙන් වැඩෙන කොටස තද පැහැයෙන්ද සෙමෙන් වැඩෙන කොටස ලා පැහැයෙන් ද දක්නට ලැබේ.

02. කොහොඹ දැවය ආශ්‍රිතව දක්නට නොලැබෙන ලක්ෂණයකි,

    (1) කෘමි උවදුරු අවමය.    (2) සාමාන්‍ය වයිරමක් ඇත.

    (3) ලීය ඔප නගියි.    (4) අරටුව ඉතා සීමිතව පවතී.


03. පාලම්, ඒ දඬු වැනි ජලාශ්‍රිත වැඩ සහ ගොඩනැගිලි වැඩ සඳහා ඉතාමත් යෝග්‍ය දැවමය ලෙස සැලකිය හැක්කේ,

    (1) කුඹුක්    (2) කැට කෑල    (3) වල්දෙල්    (4) හල්මිල්ල

04. සාම්ප්‍රදායික දැව සංරක්ෂණ ක්‍රම වලට අයත් නොවන්නකි,

    (1) තම්බා ගැනීම    (2) ගින්නෙන් තැවීම    (3) නිශ්චේවන ක්‍රමය    (4) මඩේ දැමීම

05. මෙම රූපයේ ඇති කියත හඳුන්වන නම කුමක් ද?



    (1) අත්කියත

    (2) තහඩු කියත


    (3) උල්කියත

    (4) දුනු කියත

06. ලී යතු ගගා ගැනීමේදී පුළුල් මතුපිටක් මට්ටම් කර ගැනීමට වඩා සුදුසු යත්ත වන්නේ,

    (1) කොටයත්ත    (2) කැටයත්ත    (3) මට්ටම් යත්ත    (4) පුළුක්කු යත්ත

07. මෙම රූපයේ දක්වා ඇති උපකරණය කුමක් ද?



    (1) රැචට් බුරුමයයි.

    (2) අවගාරයයි.

    (3) තොරපනයයි.

    (4) අලිස්කටුවයි.

08. දොරක ලෑලි හුලස් අතට සම්බන්ධ කිරීමේදී බහුලව අවශ්‍යවන උපකරණයකි,

    (1) G කරාමය    (2) පටි කරාමය    (3) අත්කරාමය    (4) වැද්දුම් කරාමය


09. නියන් සහ අලිස්කටු භාවිතයේදී ඒවායේ මිටට පහර දෙනු ලබන්නේ,

(1) අතකොළුවෙනි. (2) අඬු මිටියෙනි. (3) බෝල මිටියෙනි. (4) ඇක්ස්ටර් මිටියෙනි.

10. දාරයකට සමාන්තරව රේඛාවක් ඇඳගැනීමට අවශ්‍යවන උපකරණය වන්නේ,

(1) වරක්කලය (2) මට්ටම් ලෑල්ල (3) සුවාය මට්ටම් ලෑල්ල (4) හැකිලුම් කෝදුව

11. මෙම රූපයේ දක්වා ඇත්තේ ඇඳීමේ උපකරණයකි. එනම්,



(1) සවිකිරීමේ ආධාරකයකි.

(2) ''T'' රූලකි.


(3) ඇඳීමේ පුවරුවකි.

(4) කෙටි අල්ලුවකි.

12. වෙන් කිරීම සඳහා වූ කෙටි බිත්තියකට සුදුසු බැම් ක්‍රමය වන්නේ,

(1) ඉංග්‍රීසි බැම්ම (2) ප්ලෙමිෂ් බැම්ම (3) බඩගල් බැම්ම (4) ගේබියන් බැම්ම

13. මෙම රූපයේ දක්වා ඇති මූට්ටුව වන්නේ,



(1) කිඹුල්තල්ල (කයිනොක්කු) මූට්ටුවයි.

(2) අඩපලු මූට්ටුවයි.

(3) හැඩ පලු මූට්ටුවයි.

(4) හේත්තු මූට්ටුවයි.

14. පීරක් පිරිසිදු කරගැනීමට වඩා සුදුසු වන්නේ,

(1) උල්කටුව (2) රටහුණු (3) අඟුරු (4) පීරි බුරුසුව

15. පළල අඟල් 6 ක් ද දිග අඩි 8 ක් ද වූ ලෑල්ලක වර්ගඵලය විය යුත්තේ,

(1) ව.අ. 2 කි. (2) ව.අ. 4 කි. (3) ව.අ. 6 කි. (4) ව.අ. 8 කි.

16. උඩිස් වියදම් යනුවෙන් අදහස් කරනු ලබන්නේ,

(1) ප්‍රවාහන වියදම්ය.

(2) ශ්‍රමය සඳහා වියදම්ය.

(3) අමුද්‍රව්‍ය සඳහා වියදම්ය.

(4) පරිපාලන, ගෙවල්කුලී ආදී පහසුකම් සඳහාවන වියදම්ය.

17. ළිඳක් හෝ වෙනත් ජල ප්‍රභවයකින් ජලය ලබාගැනීමේදී මෝටරය හා ජල ප්‍රභවය අතර ජලය රඳවා තබාගැනීමට භාවිත කෙරේ,

(1) අග වැස්ම (2) කරාම කෙවෙනිය.

(3) කපාට කෙවෙනිය. (4) පාද කපාටය.

18. ජල ගැලීම ස්වයං ක්‍රීය ලෙස නතර කිරීම සඳහා යොදා ගනුයේ,

(1) බෝල කපාටයයි. (2) දොරටු කපාටයයි.

(3) නැවතුම් කපාටයයි. (4) ටැම් කරාමයයි.

19. කැපූ නළයක කෙලෙවර ඉතිරිවන රළුවූ කොටස (පිටත හෝ ඇතුලත) ඉවත් කිරීම සඳහා වඩාත් යෝග්‍ය මින් කුමක් ද?

(1) නළ ප්‍රකුංචයයි. (2) ලෝහ කපන කියතයි.

(3) නළ රිමරය. (4) සීරුමාරු යතුර

20. ලීයක දාර හා මුළු වක්‍රාකාරව සකස් කිරීමේදී අවශ්‍ය වේ,

(1) ලෝහ යත්ත (2) දෙකොන යතුර (3) රාස්පය (4) මට්ටම් යත්ත

21. කියතේ තෙත්තියම් තැබීම යනු,

(1) ලී ඉරීමේදී කියත තුළ ලීය සිරවීම වැළැක්වීමට ක්‍රමාණුකූලව දැති දෙපසට හැඩ ගැසීමයි.

(2) කියතේ අග සිට මුලට මුවහත් තැබීමයි.

(3) මුවහත් කිරීමට පෙර සම මට්ටමකට ගා ගැනීමයි.

(4) කියත් දත්වල කෝණ හැඩය පරීක්ෂා කරමින් ගා ගැනීමයි.

22. ස්නේහනය කිරීම මගින් ලැබෙන වාසි අතරට අයත් නොවේ,

(1) පහසුවෙන් කරකැවේ.
(2) කාර්යක්ෂම නොවේ.
(3) දිගුකල් පැවැත්ම.
(4) ක්‍රියාකාරීත්වය සුමට වීම.

23. P.V.C. නළයක් මිලදී ගැනීමේ Type 400 ලෙස සටහන්ව තිබුණි. මින් කියවෙන අදහස කුමක් ද?

(1) ප්‍රමිති අංකයකි.

(2) දියර පිරවුමට නළය ඔරොත්තු දෙන පීඩනයයි.

(3) නිෂ්පාදිත ද්‍රව්‍යයයි.

(4) නිෂ්පාදිත කාණ්ඩ අංකයයි.


24. ගැල්වනයිස් නළයක් පරීක්ෂා කිරීමේදී එහි නිල්පාට වර්ණ වළල්ලක් දක්නට ලැබුණි. එම නළය වඩාත් යෝග්‍ය වන්නේ,

(1) ඕනෑම කාර්යයක් සඳහා.
(2) බරවැඩ සඳහා.
(3) සාමාන්‍ය වැඩ සඳහා.
(4) සැහැල්ලු වැඩ සඳහා.

25. ළමා මේසයක ආධාරක කොටස මෘදු වානේ වලින් හා මතුපිට කොටස ලෑලි වලින් සකස් කොට තිබේ. මේ සඳහා සුදුසු පොදු නිමහම් ක්‍රමය කුමක් ද?

(1) ගැල්වනයිස් කිරීම
(2) පොලිෂ් කිරීම
(3) එනමල් තීන්ත ආලේපය
(4) ඉමල්ෂන් තීන්ත ආලේපය

26. මෙම රූපයේ දක්වා ඇත්තේ,



(1) වවුල් සරනේරුවකි.
(2) වල්ගා සරනේරුවකි.
(3) පැතලි සරනේරුවකි.
(4) පෙට්ටි සරනේරුවකි.

27. කොන්ක්‍රීට්වල වැඩ කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමට භාවිත කරනුයේ,

(1) කේතු ජින්තකය
(2) තළනය
(3) කම්පන උපකරණය
(4) කොන්ක්‍රීට් මිශ්‍රක යන්ත්‍රය

28. අත් කියත මුවහත් තැබීමට අවශ්‍යවන උපකරණය කුමක් ද?

(1) රෝද ගිණිගල (2) තෙල්ගල (3) පැතලි පීර (4) තුන් හුලස් පීර

29. පැතලි කපන කටුවේ මුවහත් තැබීමේ කෝණය කුමක් ද?

(1) $87^0$ (2) $118^0$ (3) $60^0$ (4) $25^0$

30. බිත්තියක ලම්බක බව හෙවත් සිරස්බව තීරණය කිරීමට අවශ්‍යවන උපකරණය කුමක් ද?

(1) ලඹය (2) වරක්කලය (3) ස්වාය මට්ටම් ලෑල්ල (4) මුටු මට්ටම


The National e-learning Portal for The General Education

31. ඒක බීජ පත්‍රී ශාකයක දක්නට ලැබෙන බාහිර ලක්ෂණ අතරට අයත් නොවේ,

(1) පත්‍ර පටුව හා දික්ව පිහිටීම. (2) බීජයේ බීජ පත්‍ර එකකින් යුක්ත වීම.

(3) පත්‍ර නාරටි සමාන්තරව පිහිටීම. (4) මුදුන් මුලක් සහිත වීම.

32. රූපයේ දැක්වෙන ජල නල උපාංග පහත ඒවා අතුරින් කුමක් ද?



(1) ඌනන ටී කෙවෙනියයි.

(2) සමාන ටී කෙවෙනියයි.

(3) කරාම ටී කෙවෙනියයි.

(4) ඌනන කරාම ටී කෙවෙනියයි.

33. බිත්තියක් කපරාදු කිරීමේදී පහත දී ඇති පියවරයන්හි පළමු පියවර ලෙස තෝරාගත යුත්තේ,

(1) කැට තැබීම. (2) මාල පිරවීම.

(3) බිත්තිය තෙත් කිරීම. (4) සුද තැබීම.

34. ආරුක්කුවක මුදුන් කොටසෙහි හරි මැදින් තබන ලද ගල හඳුන්වන නම කුමක් ද?

(1) කෝලය (2) කීල ගල (3) හුලස් ගඩොල (4) ඉලුම් කැටය

35. A3 කඩදාසියක සම්මත ප්‍රමාණය විය යුත්තේ,


(1) 297mm x 420mm (2) 210mm x 297mm

(3) 420mm x 594mm (4) 148mm x 210mm

36. වානේ කෝදුවකින් මෙට්‍රික් ක්‍රමයට මැනිය හැකි කුඩාම මිනුම කුමක් ද?

(1) 1.00mm (2) 0.5mm (3) 0.05mm (4) 0.01mm


37. වෘත්තයකින් වෙන්කරගත් රූප සටහනේ දැක්වෙන මෙම කොටස හඳුන්වන්නේ,



(1) ජ්‍යාය ලෙසය. (2) වෘත්ත කණ්ඩය ලෙසය.

(3) චාපයක් ලෙසය. (4) කේන්ද්‍රීය කණ්ඩයක් ලෙසය.

38. කෝණ සමච්ඡේදනය නිරූපණය කෙරෙන නිර්මාණයක් මෙහි දැක්වේ. මෙම නිර්මාණයේ පෙන්වා දිය හැකි කුඩාම කෝණය,




(1) $45^0$

(2) $22.5^0$

(3) $30^0$

(4) $15^0$

39. රූපයේ දැක්වෙන නිර්මාණය කුමක් දැයි පහත පිළිතුරු අතරින් තෝරන්න.




(1) සරල රේඛාවක් මත පිහිටි ලක්ෂ්‍යකට ලම්බකයක් නිර්මාණය කිරීම.

(2) සරල රේඛාවක් සමච්ඡේදනය වන සේ ලම්බකයක් ඇඳීම.

(3) බාහිර ලක්ෂ්‍යයක සිට සරල රේඛාවකට ලම්බකයක් නිර්මාණය කිරීම.

(4) සරල රේඛාවක් සමාන කොටස් දෙකකට බෙදීම.

40. කාර්මික ඇඳීමේදී කඩ රේඛාව භාවිත කරනු ලබන්නේ,

(1) සැඟිදාර දැක්වීම සඳහාය. (2) මාන යෙදීම සඳහාය.

(3) පෙනෙර දාර දැක්වීමටය. (4) මධ්‍යලක්ෂය දැක්වීමටය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** | **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II** | **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකය: |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් තෝරාගත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමි වේ.


---

(01) i. පහත දැක්වෙන යන්ත්‍ර කොටස ඍජු ප්‍රක්ෂේපණ මූලධර්ම වලට අනුව,

(1) A දෙපසින් බලා ඉදිරි පෙනුම.

(2) B පැතිපෙනුම

(3) C දෙසින් බලා සැලැස්ම අඳින්න. (සියලු මිමි mm වලිනි)




ii. පාදයක දිග 3cm වන ෂඩ්ඩි පංචාස්‍රයක් ඔබ දන්නා පිළිගත් ක්‍රමයකට නිර්මාණය කරන්න.

(02) තාක්ෂණික කාර්යයන්වල නිරත වීමේදී විශේෂයෙන් අවධානය සහ සැලකිල්ල යෙදිය යුතු අංගයක් ලෙස ආරක්ෂාව පෙන්වා දිය හැක.

i. පුද්ගලයාට හානි සිදුවිය හැකි අවස්ථා 04 ක් සඳහන් කරන්න.

ii. එවැනි අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ආරක්ෂක උපායමාර්ග 03 ක් සඳහන් කරන්න.

iii. වරක්කලය භාවිත කිරීමේ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න.

(03) ''ඉදිකිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ නිෂ්පාදනවල කොටස් එකලස් කිරීමට හා නිම කිරීමට විවිධ සවිකුරු භාවිත කිරීමට සිදුවේ.''

i. සවිකුරු වශයෙන් භාවිතවන ද්‍රව්‍ය 04 ක් නම් කරන්න.

ii. ඉස්කුරුප්පු ඇණයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

iii. ඇණ මිලදී ගැනීමේදී සැළකිය යුතු කරුණු 03 ක් සඳහන් කරන්න.

iv. දැනට භාවිතයේ පවතින සොයිබ වර්ග තුනක් සඳහන් කරන්න.

(04) ''කපරාරුව දිගු කාලීන අතීතයක් ඇති බිත්තවල නිමාව සඳහා යොදන උපක්‍රමයකි.''

i. කාමරයක් තුළ බිත්ති කපරාරු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 04 ක් සඳහන් කරන්න.

ii. කපරාරු කිරීමේ පිළිවෙල පියවර වශයෙන් ලියා දක්වන්න.

iii. කපරාරු කිරීම සඳහා අවශ්‍ය ආවුද හා උපකරණ 05 ක් ලියන්න.

iv. කපරාරු වැඩ නිමවූ පසු කටයුතු කළයුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(05) ජලය ඇතුළු වෙනත් ද්‍රව වර්ග එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට පරිවහනය කිරීම සඳහා බට හෝ නළ භාවිතයට ගනු ලැබේ.

i. PVC නළ භාවිතය ජනප්‍රිය වීමට බලපෑ කරුණු තුනක් සඳහන් කරන්න.

ii. PVC නළවල මුද්‍රණයකර ඇති තොරතුරු 02 ක් සඳහන් කරන්න.

iii. ජලනල කාර්මිකයෙකුට අවශ්‍ය වන උපකරණ 04 ක් ලියන්න.

iv. නළයකට තවත් නළයක් සම්බන්ධ කරන ආකාරය විස්තර කරන්න.

(06) වැර ගැන්වූ කොන්ක්‍රීට් කම්බි කණු නිෂ්පාදනය කිරීමට හැඩයමක් (අච්චුවක්) තනා ගැනීමට අවශ්‍ය වී ඇත. මේ සඳහා දැව භාවිත කිරීමට බලාපොරොත්තු වේ.

(කණුවේ උස 1700mm, දිග 150mm, පළල 150mවේ.)

i. හැඩයම සකස් කිරීමට අවශ්‍යවන අමුද්‍රව්‍ය 02 ක් ලියන්න.

ii. හැඩයම සකස් කිරීමට අවශ්‍යවන උපකරණ 04 ක් ලියන්න.

iii. මෙම හැඩයම සකස් කිරීමට අපේක්ෂිත වියදම් ඇස්තමේන්තුවක් සකස් කරන්න.

(07) ''දැව ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සඳහා වර්තමානයේ දී ජනතාව ඉමහත් රුචිකත්වයක් දක්වයි.''

i. දැව වල පවතින ස්වභාවික ගුණාංග 04 ක් දක්වන්න.

ii. ස්වභාවික දැව යන්න නිර්වචනය කරන්න.

iii. කෘතිම දැව යන්න කෙටියෙන් විස්තර කරන්න.


iv. දැව පදම් කිරීම යනු කුමක්දැයි කෙටියෙන් දක්වා පදම් කිරීමේ ක්‍රම 02 ක් සඳහන් කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (4) | 03. (1) | 04. (3) | 05. (2) | 06. (3) | 07. (3) | 08. (4) | 09. (1) | 10. (1) |
| 11. (2) | 12. (3) | 13. (1) | 14. (4) | 15. (2) | 16. (4) | 17. (4) | 18. (1) | 19. (3) | 20. (3) |
| 21. (1) | 22. (2) | 23. (2) | 24. (4) | 25. (3) | 26. (1) | 27. (1) | 28. (4) | 29. (3) | 30. (1) |
| 31. (4) | 32. (1) | 33. (3) | 34. (2) | 35. (1) | 36. (2) | 37. (1) | 38. (3) | 39. (1) | 40. (1) |

## II පත්‍රය


(01)




ඉදිරි පෙනුම





පැති පෙනුම



සැලැස්ම

(01) ii.




මෙම ක්‍රමය හෝ වෙනත් පිළිගත හැකි ක්‍රමයකට ලකුණු දෙන්න.

(02) i. ආවුද උපකරණ භාවිතා කිරීමේ. / නොසැලකිලිමත් කම. / විදුලිය, රසායන ද්‍රව්‍ය, ගෑස්, ගින්දර භාවිතයේදී / විවිධ භාණ්ඩ හා වෙනත් ද්‍රව්‍ය ස්ථාන ගත කිරීමේ දී ආදී ගැළපෙන පිළිතුරකට ලකුණු ලබාදෙන්න. (ල.03)

ii. ආයිත්තම් වීම කාරියට ගැලපෙන ඇඳුම් ඇඳ ගැනීම. / එල්ලා වැටෙන ඇඳුම් ගලවා තැබීම. / ඇස් හිස් පා ආවරණ පැළඳීම. / කාර්යයක් කිරීමේ දී ආරක්ෂාව / දෝෂ සහිත උපකරණ භාවිත නොකිරීම. / වැඩකරනවිට ඉඩ ඇතිව සිටීම. / යන්ත්‍ර භාවිතයේ දී ආරක්ෂාව / හැසිරීම පිළිබඳ ආරක්ෂාව ආදී කරුණු 03 ට ලකුණු (ල.03)

iii. වරක්කලය භාවිතය පිළිබඳව දක්වා ඇති නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ල.04)

(03) i. ඇණ වගී, සරනේරු, සොයිබ, කොණ්ඩි පට්ටම්, යතුරු තහඩු, ජනෙල් කොකු ආදි 04 ක් සඳහා (ල.04)


ii. A - ඇණ කට්ටය

B - ඇණ හිස

C - ඇණ කඳ

D - ඇණ පොට

E - අන්තරාලය කොටස් 04 ට (ල.02)




iii. ඇණයේ දිග / ඇණ කඳේ විෂ්කම්භය / ඇණ වර්ගය / සාදා ඇති ලෝහය / අවශ්‍ය ප්‍රමාණය කරුණු 03 ට (ල.03)

iv. ජනේල සොයිබ / දිග සොයිබ / කෑලි සොයිබ / දොර සොයිබ ආදී තුනක් සඳහා (ල.03)

(04) i. අලංකාරය / කල් පැවැත්ම / තෙතමනයෙන් ආරක්ෂා කිරීම / පිරිසිදු කිරීමේ පහසුව / සෞඛ්‍ය ආරක්ෂිත බව ආදී ගැලපෙන පිළිතුරට (ල.02)

ii. බැම්ම සකස් කිරීම / බදාම සකස් කිරීම / කැට තැබීම / සිරස් කැට අතර බදාම පිරවීම (මැල සකස් කිරීම) / මාල අතර පිරවීම / මාල අතර වැඩි බදාම මට්ටම් පොල්ල භාවිතයෙන් කපා හැරීම / කපරාරු හැන්දෙන් මැදීම / අවශ්‍යනම් හුණු කොළපු මැදීම කරුණු 04 ක් සඳහා (ල.02)

iii. කම්බි බුරුසුව / මට්ටම් ලීය / රයිසිය / සල් අඩය / කපරාරු හැන්ද / උල් හැන්ද / කොහු බුරුසුව කරුණු 03 ට (ල.03)

iv. ආවුද හා උපකරණ පිරිසිදු කිරීම / නිසි පරිදි ගබඩා කිරීම / වැඩ කළ ස්ථානය පිරිසිදු කරන්න. කරුණු 03 ට (ල.03)

(05) i. සැහැල්ලු වීම / මල බැඳීමක් නැත / ලෝහ නළ වලට වඩා මිල අඩුය / නඩත්තුව අලුත් වැඩියාව පහසුය / පහසුවෙන් ලබාගත හැකිවීම ආදී නිවැරදි පිළිතුරක් සඳහා කරුණු 03 ට (ල.02)

ii. වෙළඳ ලාංඡනය / නිෂ්පාදිත ද්‍රව්‍ය / ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය / ප්‍රමිති අංකය / නාමික බාහිර විෂ්කම්භය / පීඩන කාණ්ඩය / නිෂ්පාදිත කාණ්ඩ අංකය කරුණු 02 ක් සඳහා (ල.02)

iii. ලෝහ කපන කියත / නළ රීමරය / නළ පුකුංචය / ධ්වනි පහන ආදී කරුණු 04 ට (ල.02)

iv. කපා ගැනීම / දාර පිරිසිදු කිරීම / කෙවෙනි සකස් කිරීම හෝ ගැපෙන කෙවෙනි සපයා ගැනීම / ද්‍රවක සිමෙන්ති ආලේපය / සවි කිරීම / වියලීම / ස්ථානගත කිරීම කරුණු විස්තර කර ඇත්නම් (ල.03)

(06) i. දැව / කම්බි ඇණ / බද ඇණ සහ මුරිච්චි ආදී කරුණු දෙකක් සඳහා (ල.02)

ii. මට්ටම් යත්ත / තහඩු කියත / කැට යත්ත / අත් කියත / අඬු මිටිය / මුළු මට්ටම ආදී කරුණු 04 ක් සඳහා (ල.04)

iii. ප්‍රධාන අමුද්‍රව්‍ය / ප්‍රවාහන වියදම් / වෙනත් අමුද්‍රව්‍ය / උඩිස් වියදම් / ශ්‍රමය / ලාභය ආදී කරුණු 04 ක් ඇතුලත්විය යුතුය (ල.04)

(07) i. ශක්තිය / කල්පැවැත්ම / නැවෙන සුළු බව / අලංකාර ආදී කරුණු 04 ට (ල.02)

ii. දැව කඳන් පරිවර්තනයකර කෙලින්ම ලබාගන්නා දැව (ල.02)

iii. දැව හා දැව වල කොටස් යොදාගෙන නිර්මාණය කරනු ලබන කෘතීම ..... වේ. (ල.03)

iv. ස්වාභාවික පදම් කිරීම / පෝරණුවේ පදම් කිරීම (කෘත්‍රීම පදම් කිරීම) / මිශ්‍ර පදම් කිරීම (ල.02)